Page 3 Aug- Sep 2012.qxd 24/09/2012 07:51 Page 1



# කොළඹ කටුනායක ගුවන්තොටුපළේ නව බුද්ධ ප්‍රතිමාව



පසුගිය අගෝස්තු මස 8 වන දින ශ්‍රීලංකාවේ කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ අභ්‍යන්තරයේ ගුවන් මගීන් රැඳෙන ප්‍රදේශයේ (Passenger Transit Area) ඉතා දර්ශණීය බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කෙරිණ. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අතින් විවෘතවුණු මෙම දැකුම්කළු ප්‍රතිමාව ශ්‍රීලංකාවේ මහමේව්නා භාවනා අසපුව මගින් නිර්මාණය කර පුදන ලද්දකි.

This elegant Buddha statue can be seen in the transit area of the Colombo International Airport.

Donated by Mahamewna Meditaion Centre in Sri Lanka, it was ceremoniously opened by the Sri Lanka's President Mahinda Rajapakse on August 8, 2012.

## අතපය ඇති ලංකා කණ්ඩායම හිස් අතින් ගෙදර යද්දී

# ලංකා රණවිරු ප්‍රදීප් සංජය

# පැරලිම්පික් සම්මාන දිනයි!



සති තුනක් පුරා ලන්ඩන් නගරයේ පැවැත්වුණු, එසේම ඊයේ (9.9.12) අවසන්වුණු, ලොව වෙසෙන ශරීරාබාධිත ක්‍රීඩා ශූරයින් හා ශූරියන් උදෙසා විශේෂයෙන් සකස්වුණු 2012 ලන්ඩන් පැරලිම්පික් හෙවත් සමාන්තර ඔලිම්පික් තරඟාවලියේදී සැප්තැම්බර් 4 වන දින රාත්‍රියේ පැවති මීටර් 400 ධාවන තරඟයේදී ශ්‍රීලංකා රණවිරු උග්ගල්දෙන පතිරණලාගේ ප්‍රදීප් සංජය නම් තරුණයා ජයග්‍රහණයේ තුන්වැනි තැනට එමින් පැරලිම්පික් ලෝකඩ පදක්කම දිනා අප ශ්‍රීලංකාවට ඉමහත් කීර්තියක් අත්කර දුන්නේ ය.

එක් අතක් අප්‍රාණික ක්‍රීඩකයින් සඳහා පැවති T46 නම් තරඟ ඉසව්ව සඳහා සුදුසුකම් ලැබීමේ මූලික තරඟයේ දී ප්‍රදීප් එය තත්පර 49. 82 කින් නිම කළේය අවසන් තරඟයේ දී ඔහු එම දුර තත්පර 49. 28 කින් නිම කොට තෙවැනි ස්ථානය දිනා ලෝකඩ පදක්කම හිමිකර ගත්තේය. ප්‍රදීප් ගත් එම කාලය ආසියානු කලාපයේ නව වාර්තාවක් මෙන්ම ඔහුගේ පෞද්ගලික දක්ෂතාවද ඉක්මවා ලන්නකි. එසේම ඔහුට දෙවන ස්ථානය ගිලිහුනේ සුළු තත්පර ප්‍රමාණයකිනි. එනම් තත්පර 0 . 7 කිනි. තරඟය නැරඹූ සියල්ලෝ එය මනාව දුටහ.

1948 දී ලන්ඩන් නගරයේ පැවති ඔලිම්පික් තරඟයේ දී ශ්‍රීලාංකික ඩන්කන් වයිට් මීටර් 400 කඩුලුපැන දිවීමේ තරඟයෙන් දෙවන ස්ථානය ලබා අප රටට ප්‍රථම ඔලිම්පික් රිදී සම්මානය හිමිකර දුන්නේය. ඉන්පසු 2000 දී සිඩ්නි නුවර පැවති තරඟාවලියේ දී සුසන්තිකා ජයසිංහ ඔලිම්පික් ලෝකඩ සම්මානය දිනා අපට කීර්තියක් ගෙන ආවා ය. ගිය සතියේ ප්‍රදීප් සංජය ලත් ජයග්‍රහණය තෙවෙනි එමෙන්ම සුවිශේෂ කීර්තියක් අප රටට ගෙන ආවේ ය. ඒ මක්නිසාද යත් ඊට සති තුනකට ඉහත පැවති සාමාන්‍ය ඔලිම්පික් උළෙලට ශ්‍රීලංකාවේ සිට ක්‍රීඩක කණ්ඩායමක් පැමිණ ඒ කිසිවෙකු පදක්කම් දිනීම කෙසේ වෙතත් කිසිදු අවසාන තරඟයකට වත් සුදුසුකම් නොලබා නිකම්ම හිස් අතින් යද්දී මේ රණවිරුවා දස්කම් පා සම්මානයක් ලබාගෙන අප රටට ඉමහත් ගෞරවයක් ලබාදීමට සමත්වීමයි.

1948 ඔලිම්පික් වලදී කළ තවත් සුවිශේෂ දෙයක් වන්නේ ආබාධිතයන් වෙනුවෙන් පැරලිම්පික් තරඟාවලිය ආරම්භකිරීමයි. පැරලිම්පික්වලට සහභාගීවී මෙයට පෙර ශ්‍රීලංකා ක්‍රීඩකයෙකු ඉහළම දක්ෂතා පෙන්නුම් කළේ 2004 දී ඇතැන්ස් නුවර පැවති තරඟාවලියේ දීය. එදා පිහිනුම් ක්‍රීඩාවට ඉදිරිපත්වූ චමින්ද ප්‍රියදර්ශණ හතරවෙනි තැනට පැමිණියේ ය.

මෙවර ඔලිම්පික් පදක්කම් ලාභීන් අතරට සිය නම එක්කරමින් ශ්‍රීලංකාවට කීර්තියක් අත්කර දුන් ප්‍රදීප් සංජය ශ්‍රීලංකා යුදහමුදාවේ සිංහ රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් වරයෙකි.

1986 අප්‍රියෙල් 9 වනදා සොයුරු සොයුරියන් සිව් දෙනෙකුගෙන් සමන්විත පවුලක උපත ලද ඔහු මීරිගම දෙල්වල මහ විදුහලේ සිප්සතර හදාරා ඇත. විවාහකයෙකු වන ඔහුට එක් මසක් වයසැති බිළිඳු දියණියක් සිටී.

ශ්‍රීලංකාවේ යුද්ධය දරුණු ලෙස පැවති වකවානුවේදී එනම් 2008 දී උතුරේ සටන්බිමේ සිටි ප්‍රදීප්ගේ අතට කිලිනොච්චියේ දී වැදුණු එල්ටීටීඊ මෝටාර් වෙඩි පහරකින් ඔහුගේ වම් අතේ වැළමිටෙන් ඉහළ සහ පහළ ප්‍රදේශය ආබාධයට ලක්ව ඇති අතර ඒ නිසා වම් අත සම්පූර්ණයෙන් අක්‍රීයව පවතී.

මෙවර ඔලිම්පික් තරඟාවලියට සහභාගිවන්නට ශ්‍රීලංකාවේ සිට ලන්ඩනය වෙත පැමිණි ලංකා ක්‍රීඩක කණ්ඩායම් නිරතවන තරඟයන් ගැන ලන්ඩනයේ වෙසෙන ශ්‍රීලාංකිකයන් මහත් ආසාවකින් යුතුව ඒවා පවත්වන කාල වේලාවන් සොයමින් ඒ තරඟ නරඹනු රිසියෙන්ම ඔලිම්පික් ක්‍රීඩාංගනයට යන්නට ටිකට් ගත හැක්කේ කොහෙන් දැයි සොයමින් විශාල වෑයමක යෙදෙනු අපි දුටුවෙමු. ඔවුන් ඒ තරඟ දිනපතා රූපවාහිනියෙන් නොවරදවා නැරඹූයේ ද අපේ එක් තරඟකරුවෙක්වත් කිසියම් ජයග්‍රහණයක් කොයි මොහොතක හෝ සටහන් කරාවිය යන මහත් අපේක්ෂාවෙනි.

ඒ අපේක්ෂාව මල්පල ගන්වන්නට ප්‍රදීප් සංජය රණවිරුවාට, එසේ නැතිනම් ඔලිම්පික් ශූරයාට හැකිවිය. සැබැවින්ම ඔහු වරක් නොව දෙවරක් ජයග්‍රාහකයෙකි.

ප්‍රථමවර ඔහු යුද්ධයෙන් රට දිනවන්නට හමුදාවට බැඳී ජීවිතය නොතකා සටන්කළේය. දෙවනවර ඔහු ලන්ඩනයේ අසූ දාහක ජනතාවක් බලා සිටියදී තම උපන් රටට සම්මානයක් ගෙන ආවේය. අද දවසේ සැබෑ ජයග්‍රාහකයා ඔහු හැර අන් කවරෙක්ද?

♦ වෙනුර

Duke's Court Travel

Fly to Colombo

SriLankan Airlines (Cash plus miles offer) fr £461 + 10000 flysmiles
Qatar Airways fr £563
Kuwait Airways fr £436
Emirates (departure from Gatwick) fr £552
Etihad Airways fr £518
Oman Air fr £507
Jet Airways fr £512

Note: All fares mentioned are low season, including taxes / terms & conditions apply.

020 8748 3535

204 King Street, London W6 0RA

ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

No 1 to SRI LANKA

අප මත විශ්වාසය තබා, ලංකාවට මුදල් යවනා අපගේ දහස් ගනන් ගණුදෙනුකරුවන් ඔවුන් දුක් මහන්සියෙන් උපයාගත් මුදල්, ක්ෂණිකව සහ සුරක්ෂිතව එතෙර සිටින තම ආදරණීයන් වෙත ලබා දෙන්නේ හද පිරි සතුටෙනි.



Transfer Fees From only £5

FAST CASH
SEND TODAY - COLLECT TODAY

* දිවයින පුරා විහිදුනු කොමර්ෂල් බැංකු ශාඛා ජාලය සමග එක්ව, එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

ක්ෂණික ඇමතුම්: 020 8886 4488
www.efastcash.co.uk

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · SEYLAN BANK LIMITED · NSB · HSBC · PEOPLE'S BANK · සම්පත් බැංකුව SampathBank · NDB bank · Standard Chartered

MCG Mike Cooke Group
දින 7ම විවෘතයි